# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 අප්‍රේල් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.04.08 දින නිකුත් කරන ලදී)


# මාස් පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**මාස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. ඒම්. තාහීර් මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 72.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# මාස් පදනම (සංස්ථාගත කිරීමේ)

## මාස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

"මාස් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී සංවිධානය හා සම්බන්ධ සියලු කාරණා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ යම් කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2026 අංක    දරන මාස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මාස් පදනම සංස්ථාගත කිරීම**

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මාස් පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාස් පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

PL 15720 - 290 (2026/03)

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) වෙනත් යම් ලිඛිත නීතියක හෝ මේ පනතේ හෝ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) අගහිඟකම් ඇති පාසල් හා විශ්වවිද්‍යාල සිසු දරුවන්ට අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ශිෂ්‍යත්ව හා දිරි දීමනා ප්‍රදානය කිරීම;

(ආ) සාම්ප්‍රදායික හා වාණිජ බෝග වගා කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් දිරි ගැන්වීම, ඔවුන් දැනුම්වත් කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් සුභසාධන රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම;

(ඈ) අඩු ආදායම්ලාභී හා වරප්‍රසාදලාභී තරුණ තරුණියන්ට සවයං රැකියාවල යෙදීමට හෝ වෙනත් රැකියා ලබාගැනීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම හෝ වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ සහය වීම;

(ඉ) ස්වභාවික ආපදාවයන්හි දී හා විපත් හා අනපේක්ෂිත අවස්ථාවල දී සහන සහ සුභසාධන සැලසීම;

(ඊ) අසරණ ඉපොෂ්ය පුරවැසියන් වෙනුවෙන් විවිධ උපකාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් වෙනුවෙන් අවශ්‍ය ආධාර උපකාර කිරීම;

(උ) අඩු ආදායම්ලාභී පවුල්වල දූ දරුවන් සඳහා අධ්‍යාපනික කටයුතු ඉහළ නැංවීම වෙනුවෙන් අවශ්‍ය අධ්‍යාපනික උපකරණ හා ආධාර ලබාදීම;

(ඌ) අදාළ නීති ප්‍රකාරව ඉඩම් හා නිවාස නොමැති අසරණ පවුල් සඳහා ඉඩම් හා නිවාස ලබා දීම සඳහා සහ අඩක් ඉදිකර ඇති නිවාස ඉදිකර ගැනීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා ආධාර ලබාදීම;

(එ) රජයේ සේවයේ නිරත අය සඳහා ආකල්ප හා දැනුම වැඩි දියුණු කිරීම උදෙසා විවිධ වැඩසටහන් පැවැත්වීම;

(ඒ) අගහිගකම් ඇති අසරණ හා රෝගී තැනැත්තන්ට ආහාර, ඇස් කන්නාඩි. ඇස් කාච, ශ්‍රවන උපකරණ රෝද පුටු, කිහිලිකරු හා වෙනත් වෛද උපකරණ සහ සහන ලබා දීම;

(ඔ) පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පරිසර සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(ඕ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත්කරගැනීමට අවශ්‍ය, හිතකර සහ ආනුෂංගික වන වෙනත් කටයුතු සහ කාර්යයන් කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එම පරමාර්ථ වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ ඉන්

කවර හෝ හේතුවක් මත වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක කාර්ය සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය අතර ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය වග බලාගත යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ, අදාළ යම් ලිඛිත නීතියකට යටත්ව සහ රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන සංවිධානයක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින්, සමගාමීව පවත්වා ගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සහ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ හෝ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම්, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" වශයෙන් සඳහන් කරනු ලබන) විධායක කමිටුවක් විසින්, එම රීතිවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි වූ ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී මාස් පදනම විධායක කමිටුවේ ධුර දරන සාමාජිකයන් විසින්, (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් දක්වා ඇති ආකාරයට, (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ දී සංස්ථාපිත මණ්ඩලයේ පළමු විධායක කමිටුව පත්කරනු ලබන හෝ තෝරා පත්කර ගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලය කමිටුව වශයෙන් කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන ලෙස සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු කමිටුවට යනාදියට බලය ඇත්තේ ය.

(ඇ) අන්තර්වාර කමිටුවට යම් තීරණයක්, එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු අතර අන්තර්වාර කමිටුවේ ගණපූරණය හතරක් (4) වන අතර අවම වශයෙන් සභාපති හෝ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයෙකු ඇතුළත් විය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම පාලක කමිටුව පත්කරනු ලැබීම හෝ තෝරා පත්කරනු ලැබීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව කමිටුවේ සෑම ධුර දරන්නකු ම වසරක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගත යුතු අතර, එම වසරක කාල සීමාව ඉකුත් වීමෙන් පසුව එකී ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවයකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, කමිටුව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කරගනු ලැබූ හෝ පත්කරගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

**6.** වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතියක විධි විධානවලට යටත්ව, සංස්ථාපිත මලයේ පරාමථ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියා කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලයට බලය තිබිය යුතු ය :-

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කමිටුව විසින් නිශ්චය කරනු ලබන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ එම දේපළ බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සංස්ථාපිත මණ්ඩලය විසින් සෘජුවම හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයෙකු මාර්ගයෙන් සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම,

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ මුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලයට ලැබුණු හෝ සංස්ථාපිත මණ්ඩලයට ලබා දෙන ලද ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඇතුළු විදේශීය අරමුදල් සම්බන්ධයෙන් කමිටුව විසින් විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) (ඇ) ඡේදයේ අතුරු විධානයේ විධිවිධානවලට යටත්ව, විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වා ගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, මණ්ඩලය කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති ප්‍රකාරව, සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප් සහ දීමනා ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශීය සහ විදේශීය පුද්ගලයින් සඳහා දේශන, සම්මන්ත්‍රණ, පුහුණු සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා පවත්වා ගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) මෙම පනත මගින් බලය දී ඇති පරිදි, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වන දේ කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය ලබා දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කරුණු සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය සහ සංස්ථාපිත මණ්ඩලයේ ගණපූරණය වෘත්තීය සාමාජිකත්වයෙන් (වෘත්තීය සාමාජිකයින් සහ හවුල්කාරයන්) තුනෙන් එකක් හෝ පනහක් (50) එනම් ඉන් අඩු සංඛ්‍යාව විය යුතු ය :-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය ඉවත් කර ගැනීම, සාමාජිකත්වයෙන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම හෝ ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමේ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය සහ සේවය අවසන් කිරීම හෝ සේවයෙන් ඉවත් කිරීම, විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ වැටුප් සහ දීමනා ගෙවීම්;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හෝ කමිටුවේ රැස්වීම් කැඳවීමේදී සහ පැවැත්වීමේදී සහ එම රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම්වල ගණපූරණය සහ එහි කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ කමිටුවේ සාමාජිකයකු වීම සඳහා වන සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා පවත්වා ගෙන යාමේ, සම්බන්ධීකරණය කිරීමේ සහ ගිවිසුම් ඇති කර ගැනීමේ ආකාරය පාලනය කිරීම සඳහා වන කාර්ය පටිපාටිය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලබන යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම එවැනිම රැස්වීමකදී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සහ මේ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීති, එම රීති සාදනු ලැබීමෙන් පසු මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක්ම, එම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස දෙකක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ යම් රීතියක්, ඒ යටතේ නිසි පරිදි කරනු ලැබූ කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ එවැනි යම් රීතියක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම අවස්ථාවකදීම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

**සාමාජික නාම ලේඛනය**

**8.** කමිටුව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වා ගෙන යා යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල**

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් 6 වන වගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ විධිවිධානවලට යටත්ව, කමිටුව විසින් අනුමත කරනු ලැබූ එක් බැංකුවක හෝ ඊට වැඩි බැංකු සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී, කිරීමේදී සහ ඉටු කිරීමේදී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් සහ විගණනය**

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත්කරන ලද සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්,-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) කමිටුව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත්කරන ලද 10 වන වගන්තියේ සඳහන් සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කර විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක්ද සමග සංස්ථාපිත මණ්ඩලයේ සියලුම වත්කම් සහ බැරකම් ලැයිස්තුවක් ද, සංස්ථාපිත මණ්ඩලය විසින් ඇතුළත්

වන ලද සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වල සහ 7 වන වගන්තිය යටතේ රීතිවල තොරතුරු ද සමඟ ඒ වාර්තාව ........................ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත්කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළදී සංස්ථාපිත මණ්ඩලය වෙත විදේශීය සහ දේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක් අමුණනු ලැබිය යුතුය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී මාස් පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනම ගෙවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සියලු සාමාජික සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එකී දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

මුදල් සහ දේපළ යෙදවීම

**14.** වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල විධිවිධානවලට යටත්ව, කවර ආකාරයකින් හෝ උපචිත වූ සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් යොදා ගත යුතු අතර, ඉන් කිසිදු කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් හෝ අන්‍යාකාරයකින් කවර හෝ ලෙස සෘජුව හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස කිසිම සාධනපත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධනපත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කමිටුව විසින් තීරණය කරනු ලබන, කමිටුවේ ධුර දරන්නකු භාරයේ තැබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරි වන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේදී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, එම දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත්කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇතිව, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාපිත

මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** මේ පනතේ සඳහන් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපණය

**18.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත් බැංකුවක් අදහස් වේ; සහ

"ලිඛිත නීතිය" යන්නට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එම යෙදුමට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.